## සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

## ජුනි 04 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළඟපොළ විද්‍යාලය

**පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.**

1. ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං යන ගාථාව කියන්න.
2. සතිකගේ පාසලේ පෙර පෝය වැඩසටහනේ තිබූ අංග කියන්න.
3. සිල් වැඩසටහනකින් සංවර වන්නේ මොනවාද?
4. වෙසක් සැරසිලි තුනක් කියන්න.
5. ගොන්නු පෙර සිටි ස්ථානයටම පැමිණියේ ඇයි?
6. නායකයෙකුගේ ලක්ෂණ දෙකක් කියන්න.
7. පාසල් සිසුවෙකු සතු හොඳ ගුණාංග මොනවාද?
8. පන්තියේ හොඳම ළමයා වීමට  ඔබ සතු උසස් ගුණාංග මොනවාද?
9. පාසලේ පැවති  සිල් වැඩසටහන විස්තර කරන්න.
10. ගැල් නායකයා වතුර ඇතිබවට අනුමාන කළේ කුමක් දැකීමෙන්ද?

**දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. මුදිතා කරුණාවන්ත සිසුවියකි. (   )
2. ළිඳ හාරන විට කළු ගලක් මතු විය. (   )
3. තණකොළ පඳුරක් දැකීමෙන් ගැල් නායකයා ජලය ඇතිබව අනුමාන කළේය. (   )
4. දිනෙත් ස්වාමීන් වහන්සේගේ පා ධෝවනය කළේ ය. (   )
5. නිරුදක කාන්තාරයක ගැල් කණ්ඩායම අතරමං විය. (   )

- හිස්තැනට ගැළපෙන  නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. සිසුන් පෝය දිනයේ දී ................සමාදන් විය.  (අට සිල්/ දස සිල් )
2. පාසලේ සිල් වැඩසටහන පැවැත්වුයේ ................පෝය දිනයේ දී ය. (පොසොන් / වෙසක්)
3. පන්තියේ හොඳම ළමයා ලෙස ............. තේරුණි . (රමණී  / මුදිතා)
4. සිල් සමාදන් වූ දිනයේ  .................. සූත්‍රය සජ්ඣායනා කළේ ය.. (රතන /කරණීය මෙත්ත)
5. සතික සිල් ඇඳුම් ඇඳ...............සළුව පැළඳුවා ය.  (උතුරු/ දකුණු )

**සැම  දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !**